සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/15/SW/SMS
ඔබේ අංකය / உமது இல / Your No: ........................................
දිනය / திகதி / Date: 2025.02.27

සමෘද්ධි බැංකු /බැංකු සමිති කළමණාකරුවන් වෙත

**<u>සමෘද්ධි බැංකු පද්ධතිය තුළ කෙටි පණිවිඩ (SMS) සේවාව ක්‍රියාත්මක කිරීම</u>**

පරිගණකගත කරනලද සමෘද්ධි බැංකු පද්ධතිය තුළ වැදගත් අවශ්‍යතාවයක්ව පැවති කෙටි පණිවිඩ (SMS) සේවාව 2025 මාර්තු මස සිට නැවත ආරම්භ කරන බව ඉතා සතුටින් දැනුම් දී සිටිමි. මෙහි පලමු පියවර ලෙස පහත ගණුදෙනුවලදී කෙටි පණිවිඩ (SMS) යැවීමට නියමිතය.

1.1 සමෘද්ධි බැංකු පද්ධතිය හා සම්බන්ධ සියළුම පරිශීලකයන්ගේ මුරපද යාවත්කාලීන කිරීම (OTP) ක්‍රමවේදය භාවිතා කර අදාල පරිශීලකයාගේ ජංගම දුරකථනයට කෙටිපණිවඩයක් මගින් දැනුම් දීම.
1.2 ගනුදෙනුකරුවන් තම ගිණුමට මුදල් තැන්පත් කිරීමේදී එදින තැන්පත් කළ මුදල සඳහන් කරමින් ගණුදෙනු කරුගේ ජංගම දුරකථනයට කෙටි පණිවඩයක් මගින් දැනුම් දීම.
1.3 ගනුදෙනුකරුවන් මුදල් ආපසු ගැනීමේදී ආපසු ගත් මුදල සඳහන් කරමින් ගණුදෙනු කරුගේ ජංගම දුරකථනයට කෙටි පණිවඩයක් මගින් දැනුම් දීම.

2. මෙම සේවාව කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත බැවින් සමෘද්ධි බැංකුවල ගනුදෙනුකරුවන්ගේ ජංගම දුරකථන අංක යාවත්කාලීන කරන ලෙස මින්පෙරද ඔබ වෙත දැනුම් දී ඇත. බැංකුවේ පරිශීලකයන්ට මෙන්ම ජංගම මෘදුකාංගය (Mobile app) මගින්ද දුරකථන අංක යාවත්කාලීන කිරීමේ පහසුකම් සකස්කර ඇති බැවින් මෙය අත්‍යාවශ්‍ය කටයුත්තක් සේ සලකා කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

3. එමෙන්ම මින් ඉදිරියට පරිගණක පද්ධතිය භාවිතා කරන සියළුම පරිශීලකයන්ගේ මුරපද යාවත්කාලීන කිරීම (OTP) ක්‍රමවේදය භාවිතා කර අදාල පරිශීලකයාගේ ජංගම දුරකථනයට කෙටි පණිවඩයක් මගින් දැනුම් දීම සිදුවන බැවින් කළමණාකරු ඇතුළු සියළුම නිලධාරීන්ගේ දුරකතන අංක යාවත්කාලීන කරගැනීම පිළිබඳවද විශේෂ අවධානය යොමු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

4. මුදල් තැන්පත් කළ බවට හෝ ගිණුමෙන් මුදල් හර කළ බවට කෙටි පණිවිඩයක් නිවැරදි නොවන දුරකථන අංකයකට නිකුත්වීම බරපතල ගැටළු සහගත තත්වයන් ඇති කළහැකි අතර,

1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaram

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 288** |

එය සමෘද්ධි බැංකුවේද, දෙපාර්තමේන්තුවේද කීර්තිනාමයට හානි සිදුකළ හැකි බැවින් ගනුදෙනු කරුවන්ගේ දූරකථන අංක යාවත්කාලීන කර නිවැරදිව පවත්වා ගැනීම ඔබගේ වගකීමක් බව වැඩි දුරටත් අවධාරනය කරමි.

සී.ඩී.කළුආරච්චි

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 01. සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ), සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.